# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 444/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 13/03/2024<br>පැය 2030 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස්පතිතුමා ගාල්ල සහ ඇල්පිටිය පොලිස් කොට්ඨාසවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමුවීම - පොලිස් මූලස්ථානය.**

පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා 2024.03.13 වන අද දින ඇල්පිටිය පොලිස් කොට්ඨාසයේ සංචාරය කරමින් දකුණු පලාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා, ගාල්ල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා ඇතුළු ගාල්ල සහ ඇල්පිටිය පොලිස් කොට්ඨාසවල ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් මෙන්ම අපරාධ විමර්ශනයේ යෙදී සිටින සියළුම නිලධාරීන් කැඳවා සාකච්ඡාවක් පවත්වන ලදී.

මෙහිදී, 2024.02.26 වන දින ඇල්පිටිය පොලිස් වසමේ සිදුවූ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු වෙඩි තබා ඝාතනය කිරීම, 2024.03.11 වන දින පිටිගල පොලිස් වසමේ සිදුවූ වෙඩි තැබීමකින් පුද්ගලයින් දෙදෙනෙකු මියගොස් තවත් තිදෙනෙකු තුවාල ලැබීම සහ එදිනම අම්බලන්ගොඩ පොලිස් වසමේ සිදුවූ වෙඩි තැබීමකින් පුද්ගලයින් දෙදෙනෙකු මියගොස් තිදෙනෙකු තුවාල ලැබීම පිළිබඳව කරුණු විමසා බලන ලදී. එහිදී යුක්තිය මෙහෙයුමට සමගාමීව මෙම කොට්ඨාසවල නිලධාරීන් අපරාධ මර්දනය කිරීමෙහිලා ගෙන ඇති ක්‍රියා මාර්ග සහ එහි තිබෙන අඩුපාඩු කම් මෙන්ම ඒවා නිවැරදි කර ගත යුතු ආකාරය පිළිබඳව ද උපදෙස් ලබා දුන් අතර ඉහත සඳහන් වෙඩි තැබීම් සම්බන්ධව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් කරුණු ඉදිරිපත් කිරීමෙන් පසුව මෙම සිදුවීම්වලට සම්බන්ධ සැකකරුවන් අනාවරණය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව උපදෙස් හා නියෝග ලබා දෙන ලදී.

මෙහිදී, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අපරාධ වාර්තා කොට්ඨාසය, කොළඹ අපරාධ කොට්ඨාසය, ප්‍රජා පොලිස් කොට්ඨාසය, පොලිස් විශේෂ කාර්ය බලකාය හා බුද්ධි අංශ ඇතුළු සියළුම නිලධාරීන් කැඳවා මෙම අපරාධ විසඳීමෙහිලා එකිනෙක සම්බන්ධීකරණය වීම, තොරතුරු හුවමාරු කර ගැනීම හා නිලධාරීන් කටයුතු කල යුතු ආකාරය පිළිබඳ අවශ්‍ය නියෝග

ලබා දීමට ද කටයුතු කෙරිණි. මෙම සිදුවීම්වලදී පොලිස් ස්ථානාධිපතිවරුන් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ යම් දුර්වලතාවයක් තිබිණිද යන්න සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන බවත්, එම පරීක්ෂණවලින් නිලධාරීන් පිළිබඳව යම් දුර්වලතා අනාවරණය වුවහොත් එම නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරන බවටත් අවධාරණය කෙරිණි.

එසේම මෙවැනි අපරාධ යළිත් සිදු නොවන ලෙසට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමටත් පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා සහ පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන්ට උපදෙස් ලබාදුන් අතර මෙම සාකච්ඡාව කොස්ගොඩ පොලිස් ස්ථානයේ පිහිටි ඇල්පිටිය පොලිස් කොට්ඨාස සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලදී.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**